# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් **2011** දෙසැම්බර් **31** දිනට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී.ලං.ගි.ප්‍ර. අංක 03 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙස ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දැක්විය යුතු සංස්ථාවට එරෙහිව ඇති නඩු සම්බන්ධයෙන් වූ අසම්භාව්‍යයන් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 12 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාරව වත්කම් බැරකම්වලට හිලව් නොකළ යුතු වුවත් අමාත්‍යාංශ හා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබිය යුතු ගිණුම්වල එකතුව රු.1,072,579 ක් වූ බැර ශේෂය ජංගම වත්කම්වලින් අඩුකොට දක්වා තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වටිනාකම රු.199,746,090 ක් වූ ණයගැති ශේෂ සම්බන්ධයෙන් අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි.**

**(ආ) වත්කම් ක්ෂය කිරීම් ගිණුම්ගත කිරිමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(i) වත්කම් මිලදී ගත් දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී මිලදී**

**ගත් වටිනාකම රු.107,391,542 ක් වූ වත්කම් ක්ෂය කර නොතිබුණි.**

**(ii) වටිනාකම රු.8,405,735 ක් වූ ඉන්ධන බෙදාහැරීමේ ඒකක හා ට්‍රොලි වාහනය ක්ෂය කර නොතිබුණු අතර ක්ෂය කළ යුතු අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.**

**(iii) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය වටිනාකම රු.5,713,042 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.**

**(iv) සමාලෝචිත වර්ෂයේ ක්ෂය සඳහා වෙන්කිරීම් වටිනාකම වූ රු.588,241,847 ක් කෙරීගෙන යන වැඩ වලින් ද අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.**

**(ඇ) ජංගම නොවන වත්කම් යටතේ වෙනම විෂයයක් ලෙස හෙළිදරව් කළ යුතු කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වටිනාකම වූ රු.18,704,293 ක් ස්ථාවර වත්කම් ගිණුමට මාරු කිරීම හේතුකොටගෙන එම වටිනාකමින් ස්ථාවර වත්කම් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.**

**(ඉ) සමාලෝචිත වර්ෂයේ කල්බදු පොළිය රු.647,077 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.**

### 1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) පහත සඳහන් එක් එක් විෂයයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනස්කම් නිරීක්ෂණය විය.**

| විෂයය | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය | උපලේඛනයෙහි දක්වා ඇති ශේෂය | වෙනස |
| --- | --- | --- | --- |

| | - | | |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ණයගැතියෝ | **24,826,945** | **23,515,143** | **1,311,802** |
| ගමන් වියදම් අත්තිකාරම් | **176,168** | **175,143** | **1,025** |
| විශේෂ අත්තිකාරම් | **10,654,829** | **9,582,626** | **1,072,203** |
| කලින් ගෙවීම් | **45,527,950** | **28,342,466** | **17,185,484** |
| ප්‍රධාන කාර්යාල ගිණුම | **28,533** | **(9,397)** | **37,930** |
| අත ඉතිරි මුදල් | | | |
| - ගාල්ල | **213,526** | **9,622** | **203,904** |
| - බේරුවල | **3,642,320** | **81,719** | **3,560,601** |
| - හම්බන්තොට | **304,878** | **307,878** | **3,000** |
| ස්ථාවර වත්කම් | | | |
| | **4,635,032,102** | **4,607,922,074** | **27,110,028** |
| මිරිස්ස වරායේ ණයහිමියෝ | නැත | | |
| | | **392,943** | **392,943** |
| නැරඹීමේ ආදායම | | | **3,645** |
| | **5,179,860** | **5,176,215** | |

(ආ) ඉදිරිපත් කර තිබූ ශේෂ පිරික්සුමෙහි පහත සඳහන් පරිදි ණයගැතියන්ගේ බැර ශේෂ එකතුව රු.**47,980,486** ක් වී තිබුණි.

| විස්තරය | බැර ශේෂ වටිනාකම |
|---|---|
| | රු. |
| පුරාණවැල්ල | |
| -ඉන්ධන ණයගැතියෝ | **514,638** |
| - කොඩ්බේ | **1,417,824** |
| ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබිය යුතු මුදල් | **44,707,321** |
| සුළු මුදල් අග්‍රිමය - මෝදර | **634** |
| - වැඩපල | **385** |
| මිරිස්ස වරායේ අතැති මුදල් | **1,339,684** |
| එකතුව | **47,980,486** |

**1.2.4** ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **ණයගැති ශේෂය හා කාර්ය මණ්ඩල ණයගැති ශේෂ පිළිවෙලින් රු.199,746,090 ක් හා රු.17,343,290 ක් වී තිබූ අතර මෙම ණය ශේෂ අයකරගැනීම මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.**

**(ආ)** **මිරිස්ස ධීවර වරායේ යාන්ත්‍රික කම්හල බදුදීමෙන් 1999 සිට 2006 අගෝස්තු මාසය දක්වා සංස්ථාවට ලැබිය යුතු බදු මුදලෙහි වටිනාකම රු.332,382 ක් වී තිබූ අතර, එම බදු මුදල් අයකර ගැනීම සඳහා සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.**

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

**සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.4,657,710,369 ක්වූ පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 4,635,032,102 | ස්ථාවර වත්කම් ලේඛනය |
| වැටුප් අත්තිකාරම් | 247,795 | විස්තරාත්මක උපලේඛන |
| මුදල් හුවමාරු පාලන ගිණුම | 974,317 | විස්තරාත්මක උපලේඛන |
| කුඩාවැල්ල එකතු ගිණුම | 6,250,706 | උපලේඛන හා බැංකු සැසඳුම් ප්‍රකාශ |
| මූල්‍ය ගාස්තු | 10,349,232 | විස්තරාත්මක උපලේඛන |
| අනෙකුත් තැන්පතු | 4,856,217 | විස්තරාත්මක උපලේඛන |
| එකතුව | 4,657,710,369 | |

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

**පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන් ආදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 21 දෙනෙකු සඳහා ලබා දී තිබූ එකතුව රු.2,342,960 ක් වූ අත්තිකාරම් නිරවුල්කර නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තිය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සේවකයින් වෙනත් ආයතනයන්ට මුදාහැර එම සේවකයන් වෙනුවෙන් වැටුප් ලෙස රු.493,992 ක් ගෙවා තිබුණි. |

**1.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2009 වර්ෂය දක්වා ඉදිරියට ගෙන ආ අලාභය වූ රු.389,613,495 ක් හා ලියාහැරිය යුතු ශේෂ ලෙස දක්වා තිබූ රු.81,769,569 ක් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.190,648,226 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.164,314,807 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,333,419 ක් හෙවත් සියයට 16 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. කාර්ය මණ්ඩල පිරිවැය, ආයතන හා පරිපාලන පිරිවැය හා මූල්‍ය පිරිවැය වැඩිවීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 සංස්ථාව නමින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

**කිරින්ද ධීවර වරායේ මුහුදු වැලි කියුබ් 100,000 ක් ඉවත්කර ගැනීම සඳහා පුද්ගලික ආයතනයකට රු.මිලියන 69 ක මුදලක් (බදු රහිත) අත්තිකාරම් වශයෙන් ගෙවා 2006 වර්ෂයේදී පවරා දී තිබුණද අදාල කාර්යය 2011 වර්ෂය අවසාන වන විටත් ඉටුකර නොතිබුණි. යථෝක්ත අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දී රු.76,261,312 (එකතු කළ අගය මත බදු සහිත) වී තිබුණු අතර එම ණයගැති ශේෂය, ණයහිමි ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන්ට එරෙහිව නඩු පවරා තිබුණි.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු ධීවර වරායයන් 17 කින් වරායයන් 06 ක පහත පරිදි මෙහෙයුම් අලාභ තත්ත්වයක් නිරීක්ෂණය විය.

| ධීවර වරාය | 2011 වර්ෂයේ අලාභය | 2010 වර්ෂයේ අලාභය | පසුගිය වර්ෂයට සාපේක්ෂව අලාභයේ වැඩිවීම / (අඩුවීම) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | % |
| මිරිස්ස | (6.877) | (1.147) | 500 |
| දොඩන්දූව | (3.971) | (3.408) | 17 |
| හික්කඩුව | (5.585) | (4.188) | 33 |
| කල්පිටිය | (2.584) | (3.469) | (26) |
| හලාවත | (5.418) | - | - |
| වාලච්චේන | (5.944) | - | - |

(ආ) ධීවර වරායයන් 03 ක මෙහෙයුම් ලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි. විස්තර පහත පරිදි විය.

| ධීවර වරාය | 2011 වර්ෂයේ ලාභය | 2010 වර්ෂයේ ලාභය | ලාභයේ අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | % |
| පුරාණවැල්ල | 1.281 | 2.078 | 38 |

| | | | |
|---|---|---|---|
| **කොඩ්බේ** | **8.796** | **11.197** | **21** |
| **මෝදර** | **38.266** | **39.364** | **3** |

**(ඇ)** **වියදම් විෂයයන් 12 ක් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 100 ඉක්මවූ ප්‍රතිශතවලින් වැඩිවී තිබුණි.**

**3.2 නිෂ්කාර්ය සම්පත්**

**2007 වසරේදී ස්ථාපිත කරන ලද වටිනාකම රු.13,456,059 ක් වූ අන්තර්ජාල පහසුකම් සහිත අභ්‍යන්තර දුරකථන පද්ධතිය අපේක්ෂා කළ අරමුණු ඉටු නොවීම හේතුකොටගෙන නිෂ්කාර්යව තිබුණි.**

**3.3 ආර්ථික නොවූ ගනුදෙනු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **ආසියානු සංවර්ධන බැංකුවේ සහ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ආධාරවලින් රු.මිලියන 224 ක වියදම් කර හලාවත ධීවර වරාය ආරම්භ කර තිබුණ ද, එම වරාය තුළින් ඉටුවිය යුතු මූලික කාර්යයන් ඉටු නොවන බැවින් එහි සේවය කරන මානව සම්පත නිෂ්ක්‍රීය බවට පත්වී තිබුණි. ඒ වෙනුවෙන් වැටුප්, වේතන හා අතිකාල වශයෙන් එකතුව රු.7,519,468 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.**

**(ආ)** **සංස්ථාව සතුව නිතිඥවරුන් 03 දෙනෙකු සිටියදී බාහිර නීතිඥයන් සඳහා රු.498,600 ගාස්තුවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.**

**3.4 හඳුනාගන්නා ලද පාඩු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **සේවක අර්ථසාධක අරමුදල් දායක නියමිත දිනට නොගෙවීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.4,505,835 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි.**

**(ආ)** **මෝදර ධීවර වරාය තුළ නැංගුරම් ලා තිබූ යාත්‍රාවකින් අයවිය යුතුව තිබූ නැංගුරම් ගාස්තුව රු.10,520,113 ක් වුවද, ඉන් රු.4,844,739 ක මුදලක් පමණක් ගෙවා තිබියදී යාත්‍රාව නිදහස් කිරීම හේතුකොටගෙන සිදු වී තිබුණු මූල්‍යමය අලාභය රු.5,675,374 ක් වී තිබුණි.**

**(ඇ)** **සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී බැංකු අයිරා පොළී වශයෙන් රු.1,214,552 ක් ගෙවා තිබුණි.**

**4.** **ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වූවත්, එම උපදෙස්වලින් බැහැරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 15 ක් ඉකුත් වීමෙන් පසුව එනම් 2013 මැයි 31 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.**

**(ආ)** **මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන පරිදි පිළියෙල කර ඇති බවට විවෘත හා කොන්දේසි විරහිත ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.**

**4.2** **ප්‍රසම්පාදන සැලැස්ම**

**සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.**

**4.3 අයවැය ලේඛනමය පාලනය**

**----------------------------**

**සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට අනුරූපව අයවැය ලේඛණය තාත්ත්විකව සකස් කර නොතිබීම නිසා, අයවැය ලේඛනය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකියයුතු විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.**

**5. පද්ධති හා පාලන**

**-------------------**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.**

**(අ) ආදායම**
**(ආ) ගිණුම්කරණය**
**(ඇ) ණය හිමියෝ**
**(ඈ) ණය ගැතියෝ**
**(ඉ) වත්කම් පාලනය**
**(ඊ) පෙර ගෙවුම් හා තත්ත්කාර්ය අතුරු අග්‍රිම පිළිබඳ පාලනය**
**(උ) සේවක මණ්ඩල කළමනාකරණය**
**(ඌ) අයවැය පාලනය**